**වනජීවී සංරක්ෂණ අරමුදල - 2015**

--------------------------------------------

වනජීවී සංරක්ෂණ අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 22 දරන වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත මගින් සංශෝධිත වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 71(2)(උ) යටතේ නිකුත් කරනු ලබන නියෝග සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**

-------------------

2.1 **මතය**

----------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගුවන් පණිවිඩ යන්ත්‍ර තරංග මාලා ගාස්තු සඳහා ගෙවිය යුතු රු.449,155 ක් ද උසාවි දඩ මුදල් රු. 1,341,000 ක් ද ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) හුණුවිලගම ආපනශාලාව හා පොත් අලෙවිසැල ඉදිකිරීමේ වියදම වූ රු. 1,934,033 ක් ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කළ යුතු වුවත් ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ලෙස පෙර වර්ෂයට ගලපා තිබුණි.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

සේවා ගාස්තු රු.11,032,522 ක් තෙවසරක සිට පරිශේෂව පැවතියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම.** |
|---|---|---|
| (අ) | 2008 මාර්තු 05 දිනැති අංක වජී/6/1/2/458/11 දරන වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය | සහකාර අධ්‍යක්ෂ (මහවැලි) විසින්, මනම්පිටිය ආශ්‍රිතව මහවැලි ගඟේ වැලි ඉවත්කිරීම පිළිබඳව අධීක්ෂණය කර, ඒ පිළිබඳ වාර්තාවක් සෑම සතියකම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සැපයිය යුතු වුවත් එම නියමය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2015 ඔක්තෝබර් 08 දිනැති අංක වජී/2/01/01 දරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | ජාතික උද්‍යානවල පරිගණකය මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේදී, විදුලි බලය නොමැති අවස්ථාවලදී, පොදු 172 මුදල් කුවිතාන්සි නිකුත් කිරීමේදී සිදුවිය හැකි අක්‍රමිකතා වැලැක්වීමට ජෙනරේටර් යන්ත්‍ර හඳුන්වාදී තිබුණද ඒවා පාවිච්චි කිරීම සම්බන්ධයෙන් හඳුන්වාදුන් උපදෙස් මාලා අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 දෙසැම්බර් 11 දිනැති අංක පීඑෆ්ඩී/04/08/01/59 පොදු අංක දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | මනම්පිටිය ආශ්‍රිත වැලි ලබාදීමේදී සෑම තෙවර්ෂයකට වරක් සුදුසු පරිදි රාජ්‍ය භාගය සංශෝධනය කිරීමට පියවර ගතයුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි. |

2.5 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේදී ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට රු. 46,225,450 ක දිරි දීමනා ගෙවා තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**
**------------------------**

3.1. **මූල්‍ය ප්‍රතිඵල**
**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 942,005,927 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.735,934,278 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 206,071,649 ක වර්ධනයක් දක්නට ලැබුණි. උද්‍යාන පිවිසුම් ගාස්තු ආදායම රු. 263,225,311 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. ඉකුත් වර්ෂ 05 ක දායකත්වය සලකා බැලීමේදී එහි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

3.2 **වියදම්වල අසාමාන්‍ය වැඩි වීම.**
**---------------------------------**

2015 වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව අලිවෙඩි මිලදී ගැනීමේ වියදම රු. 18,017,935 කින් ද සේවා ගාස්තු වියදම රු.31,266,478 කින් ද වැඩි වී තිබුණි. එසේ වුවද සතුන් නිසා ජීවිත හානි 63 ක් සමාලෝචිත වර්ෂයේදී සිදුවී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**
**----------------------------**

4.1 **කාර්යසාධනය**
-----------------

අරමුදලේ කාර්යයන් ලෙස

- වනසතුන් ආරක්ෂා කිරීම හා සුරක්ෂණය කිරීම කෙරෙහි මහජන උද්යෝගය දියුණු කිරීම.

- වනසතුන් ආරක්ෂා කිරීමේ හා සුරක්ෂණය කිරීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබූ සියලු ප්‍රදේශ පවත්වාගෙනයාම, දියුණු කිරීම හා වර්ධනය කිරීම.

- ස්වකීය බලතල පාවිච්චි කිරීමේදී හෝ විශිෂ්ඨ දක්ෂතාවය හෝ නිර්භීතභාවය පිළිඹිබු කොට ඇති නිලධරයන්ට සහ මහජනයාට පාරිතෝෂිත හෝ ප්‍රදාන පිරිනැමීම.

- වනසතුන් හා වෘක්ෂලතා අඥාපනතේ 11 වන උපලේඛනයෙහි නියමිත යම් යම් ලිඛිත නීතියක් යටතේ සිදුකරනු ලැබූ වැරදි සඳහා තැනැත්තන් වැරදිකරුවන් කිරීම සඳහා නියම ලෙස හෝ අනියම් ලෙස දැනුම් දෙන්නන් වශයෙන් හෝ අන් ලෙසකින් වගකිව යුතු තත්ත්වයට පැමිණ සිටින තැනැත්තන් හට පාරිතෝෂික හෝ ප්‍රදාන පිරිනැමීම සහ පූර්වෝක්ත පරමාර්ථ අතුරෙන් කිසිවකට සම්බන්ධ වූ සියලු කරුණු දියුණු කිරීම හා වර්ධනය කිරීමද දක්වා තිබුණි.

ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව සිදුකළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල ගැටළුව විසඳීමේ අරමුණින් සෝලා ජල පොම්ප ඒකක 03 ක් යාල වනෝද්‍යානයේ සවි කිරීමට රු. මිලියන 1.8 ක් ඇස්තමේන්තු කර තිබුණද 2015 වර්ෂයේදී එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) දර්ශන වැව හා කරුවලගස්වැව යන වැව් ප්‍රතිසංස්කරණය කිරීමට හා සංචාරක බංගලා 04 ක් ඉදිකිරීමට පිළිවෙලින් රු. මිලියන 13 ක් හා රු. මිලියන 73 ක් ඇස්තමේන්තු කර තිබුණද 2015 වර්ෂයේදී ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ සිට යාල කාර්ය මණ්ඩල සංචාරක නිවාසයේ අත්‍යාවශ්‍ය භාණ්ඩ හා උපකරණවල හිඟකම නිසා එය භාවිතයට ගෙන නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට 2016 මැයි මාසය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාහන 86 කට රක්ෂණාවරණය ලබාගැනීමට අරමුදලින් ගෙවූ රු. 5,823,516 ක් දෙපාර්තමේන්තුවෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වන අලි පාලනය සඳහා යොදා ගැනීමේ අරමුණින් බෝර 12 රබර් උණ්ඩ 7,500 ක් මිලදී ගැනීමට 2014 අගෝස්තු 15 දින රු. 4,178,965 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවට ගෙවා තිබූ නමුත්, එම රබර් උණ්ඩ තොගය 2016 මැයි 11 දින දක්වා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 ජූනි 30 දින ඉදිකිරීම් නිමකර භාරදී තිබුණු නිල්ගල සංචාරක නිවාසය විගණිත දිනය වූ 2016 මැයි 20 දක්වාම භාවිතයට ගෙන නොතිබූ අතර වැය කළ රු.3,291,392 ක මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. වර්ෂ 02 ක පමණ කාලයක් පරිහරණයෙන් තොරව පැවති බැවින් එම කාලය තුළ අරමුදලට ලබාගත හැකිව තිබුණු ආදායමක් අහිමි වී තිබුණි. නිවාසය භාවිතා නොකිරීමට හේතුව ඒ සඳහා මුළුතැන්ගෙයක් නොතිබීම ලෙස දක්වා තිබුණද 2015 වර්ෂයේදී රු.764,699 ක් වැය කර මුළුතැන්ගෙයක් ඉදි කර තිබුණි.

(ඇ) රු.11,727,309 ක් වැයකර ඉදිකළ වීවල සංචාරක නිවාසයට ළඟාවීමට ඇති මාර්ගය දුෂ්කර බැවින් හා සංචාරක නිවාසයට ස්ථිර ජල සැපයුමක් නොමැතිකම නිසා වසර 02 ක සිට එය ඌන උපයෝජිතව පැවතුණි.

4.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---

අරමුදලේ අරමුණුවලින් බැහැරව සමාලෝචිත වර්ෂයේ කැලැන්ඩර් හා දිනපොත් මුද්‍රණයට රු.3,025,974 ක් වියදම් කර තිබුණි.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

2013 වර්ෂයේ දී රු. 14,456,219 ක් වැයකර ඉදිකළ මහවැව සංචාරක බංගලාව සංචාරකයින්ට විවෘතව පැවතියද එයට ළඟාවීමේ මාර්ගයේ අපහසුතා පැවතීම හේතුවෙන් සංචාරකයින්ගේ පැමිණීම අඩු මට්ටමක පැවති බැවින් මෙම බංගලාව අනාරක්ෂිතව අවුරුදු 2 ක් වසා දමා තිබුණි.

4.6 **හඳුනා ගන්නා ලද පාඩු**

---

ගිරාඳුරුකෝට්ටේ අලිපාලන ඒකකයට අයත්ව තිබූ කැබ් රථය 2015 මැයි 06 දින අනතුරට පත්වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර, මෙම අනතුරින් රථයට දළ වශයෙන් රු.300,000 ක අලාභයක් සිදුවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11 ක රු.11,092,437 ක් අඩුවෙන් ඇස්තමේන්තුගත කර තිබූ අතර වැය විෂයයන් 07 ක අයවැය ගත සීමාව ඉක්මවා රු. 8,878,352 ක් වියදම් කර තිබුණි. තවද අරමුදලේ අයවැය ලේඛනය 2016 මාර්තු 04 දින සංශෝධනය කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

විගණනයෙන් පෙන්වා දුන් පහත දැක්වෙන කරුණු නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙම වාර්තාවේ දිනය වන විටත් සිදුකර නොතිබුණි.

(අ) අංහම්මැඩිල්ල ජාතික උද්‍යානයේ අලි ගාල් කිරීම හා අලි ගොඩබෑමේ වේදිකාව ඉදිකිරීම වෙනුවෙන් 2008 වර්ෂයේදී රු.4,574,919 ක් වැය කර තිබුණද ගොඩනැගිලි නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) මන්නාරම කාර්යමණ්ඩල නිල නිවස, වන අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවස ඉදිකිරීමට රු.8,630,360 ක වටිනාකමකට 2011 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කර 2011 වර්ෂය අවසානයට පෙර වැඩ නිම කිරීමේ එකඟතාවය මත රු. 1,933,200 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානයටත් ව්‍යාපෘතියේ වැඩ ආරම්භකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | දඩ මුදල් එක් රැස් කිරීම හා ප්‍රසාද දීමනා ගෙවීම. | දඩ මුදල් ලැබීම් නිසි පරිදි අදාළ වර්ෂයන් අනුව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | ලිපි ලේඛන පවත්වාගෙන යාම. | පරිගණක ලේඛන, උප පත්‍රිකා පොත් ලේඛන සහ විස්තරාත්මක උප ලේඛන පවත්වා නොතිබීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු සිදු කර නොතිබීම. |
| (ඈ) | තොග පාලනය. | ප්‍රාදේශීය කාර්යාලවල තොග ලේඛන නිසි පරිදි පවත්වා නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඉ) | ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම | පරිගණකය මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් නොකරන අවස්ථාවල අයථා මුදල් පරිහරණයට ඉඩ සැලසීම හා ලැබෙන මුදල්වල නිවැරදිතාවය ගැන සෑහීමට පත්විය නොහැකි වීම පිළිබඳව අවධානය යොමු කර නොතිබීම. |
| (ඊ) | අයවැය පාලනය. | අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර විචල්‍යතාවයන් පැවතීම. |